www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපති යුද අයවැයක් ඉදිරිපත් කරයි

## Sri Lankan president hands down war budget

**සමන් ගුනදාස විසිනි**
**2007 නොවැම්බර් 13**

මුදල් ඇමති ධූරය ද දරන ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ යුද අයවැයක් යනුවෙන් පමනක් ම විස්තර කල හැකි අයවැයක් නොවැම්බර් 7 දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලේ ය. ආරක්ෂක වියදම් සඳහා වාර්තාගත මුදල් වෙන් කිරීමක් නිවේදනය කරමින් ආන්ඩුව වියදම් දරන අංශවලින් "මාතෘ භූමිය ආරක්ෂා කිරීම" මූලිකත්වය ගන්නා බව ඔහු අවධාරනය කලේ ය.

දිවයින නැවත සිවිල් යුද්ධය කරා ඇදගෙන යාම සම්බන්ධයෙන් රාජපක්ෂ සෘජුවම වගකිව යුතු ය. 2005 නොවැම්බර් මාසයේ දී ඔහු යන්තමින් ජනාධිපතිවරනය ජයගැනීමෙන් පසුව 2006 ජූලි මස ඇරඹුනු විවෘත මිලිටරි ප්‍රහාරයන් සමග ක්ෂනික ආතතීන් ඉස්මත්තට පැමිනීමට පටන් ගත්තේ ය. "ඊනියා සටන් විරාම ගිවිසුමේ විපාකයක් ලෙස ත්‍රස්තවාදීන්ගේ පාලනය යටතට පත්ව තිබුනු ප්‍රදේශ ද ඇතුලත්ව සමස්ත නැගෙනහිර පලාත ම සාර්ථක මානුෂික මෙහෙයුමක් මගින් මුදාගැනීම" පිලිබඳව ජනාධිපතිවරයා තම අයවැය කතාවේ දී විවෘත පාරම්බෑමක යෙදුනේ ය.

"ඊනියා" යන යෙදුම භාවිතා කිරීම, 2002 දී එක්සත් ජාතික පක්ෂ-නීත ආන්ඩුව හා දෙමල ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර අත්සන් කෙරුනු සටන් විරාම ගිවිසුම කෙරෙහි රාජපක්ෂගේ පිලිකුල අවධාරනය කොට දක්වයි. ඔහු සඳහන් කරන " මානුෂික" මෙහෙයුම යනු සිය ගනනක් සිවිල් වැසියන් ඝාතනය කොට, තවත් දස දහස් ගනනකට උන් හිටිතැන් අහිමි කල නැගෙනහිර පලාතේ මිලිටරි ප්‍රහාරයයි.

තම ආන්ඩුවේ අභිප්‍රාය එල්ටීටීඊය විනාශ කිරීම සඳහා පූර්න පරිමාන යුද්ධයක් දියත් කිරීම බව රාජපක්ෂ අත්‍යන්තයෙන් පැහැදිලි කොට ඇත. එල්ටීටීඊය විසින් එල්ල කරන ලද ප්‍රතිප්‍රහාරයක්, එනම් පසුගිය මාසයේ දී අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට එල්ල වූ හදිසි පහරදීම, දඬමීමා කරගනිමින් "ඔවුන් ( එල්ටීටීඊය) ආයුධ අත්හැර ප්‍රජාතාන්ත්‍රික දේශපාලන විසඳුමකට කිසි දිනක එකඟ නොවනු ඇත. ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම හැර අපට වෙනත් විකල්පයක් නැත" යයි ඔහු ගුගුලේ ය.

මෙම යුද්ධය දියත් කිරීමට 2008 වසර සඳහා මිලිටරි අයවැය රුපියල් බිලියන 166ක් (ඇමරිකානු ඩොලර් බිලියන 1.5ක්) දක්වා තවත් සියයට 20කින් ඉහල දැමීමට රාජපක්ෂ පියවර ගෙන ඇත. රාජපක්ෂ බලයට පත්වීමෙන් පසුව ආරක්ෂක වියදම සියයට 265ක යෝධ පරිමාවකින් ඉහල දමනු ලැබ ඇති අතර දැනට එය සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 16ක් ගිල ගනී. රටේ ජනගහනයෙන් බහුතරයක් දිනකට ඇමරිකානු ඩොලර් 1ට වඩා අඩු ආදායමක් ලබමින් යන්තමින් එදිනෙදා ජීවිතය ගැටගසාගන්නා අතරේ දෛනික මිලිටරි වියදම ඩොලර් මිලියන 4 කි.

"අපගේ මාතෘභූමිය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලැබ ඇති ප්‍රමුඛත්වය කිසිදු අභියෝගයක් හමුවේ අනතුරේ නො හෙලිය යුතු ය" යි තම අයවැය කතාවේ දී ජනාධිපතිවරයා කීය. වර්තමාන ආරක්ෂක වියදම මහජන සෞඛ්‍යය හා අධ්‍යාපනය වෙනුවෙන් කරන සමස්ත වියදම මෙන් එකහමාර ගුනයකි.

අයවැය කතාව ඉදිරිපත් කල දිනයේ ම උතුරේ වන්නි ප්‍රදේශයේ එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා සන්නද්ධ හමුදා නව මෙහෙයුමක් දියත් කලහ. යුද ටැංකිවල හා ගුවන් ප්‍රහාරක යානාවල සහයෝගය ලැබුන ද තදබල ගැටුම්වලින් ආන්ඩුවේ හමුදා පසුබස්සවනු ලැබූහ. හමුදාවේ 11ක් මියගොස් 41ක් තුවල ලැබූ බව නිල වාර්තා පැවසුවත් සැබෑ සංඛ්‍යාවන් මීට වඩා බොහෝ වැඩි විය හැකිය.

සියලු කරුනුවලට අනුව මෙම මෙහෙයුම අයවැයේ පනිවුඩය අවධාරනය කිරීම සඳහා නරුම ලෙස පූර්වයෙන් සැලසුම් කෙරුනක් වීමේ ඉඩකඩ පවතී. " ප්‍රහාරය දියත් කරනු ලැබීමටත් කලින් හමුදා වන්නි ද්වාර මන්ඩපයේ සිටින තතු තුල මහජනයාට තම බඩ හා කට අමතක කරන ලෙස බල කෙරෙන පෝස්ටර් කොලඹ නගරයේ සමහර ප්‍රදේශවල අලවා තිබුනි" යයි පසුගිය සති අන්ත සන්ඩේ ටයිම්ස් පත්‍රයේ " දේශපාලන තීරුලිපියේ" සඳහන් විය.

යුද්ධයට ද එහි ප්‍රතිඵලයක් ලෙස පැටවෙල ආර්ථික බරට ද එරෙහිව වැඩෙන මහජන මතය පිලිබඳව රාජපක්ෂ ආන්ඩුව ඉතා හොඳින් දැනුවත් ය.

විශේෂයෙන් තෙල් ඇතුලුව ලෝක වෙලඳපොලේ භාන්ඩවල මිල ඉහල යාම නිශ්චිත සාධකයක් වුවත් ආරක්ෂක වියදම යෝධ ලෙස වැඩිවීම වැඩකරන ජනයා මත අතිශය අහිතකර ලෙස බලපාන පිම්මේ ඉහල යන උද්ධමනයකට දායක වී ඇත. මහජන කෝපය ඉවතට හැරවීම ඉලක්ක කරගනිමින් මතුපිට පියවරයන් ගනනාවක් ම රාජපක්ෂ ඉදිරිපත් කල ද අයවැයේ සමස්ත තෙරපුම රටෙහි ආර්ථික හා සමාජ අර්බුදය ගැඹුරු කරනු ඇත.

"යෝධ යුද වියදම රටෙහි ගැඹුරු මූල්‍ය හා ගෙවුම් ශේෂ ගැටලුවක් බවට පත්ව ඇත. මෙසේ සිදුවන්නේ ආර්ථිකය මත යුද්ධයේ විපාකවලට ද යුද්ධය ආර්ථිකයේ වර්ධනයට ගැඹුරු බාධකයක් ය යන ප්‍රතික්ෂේප කල නො හැකි කරුනට ද අමතර ව ය. මිලිටරි දෘඩාංග හා යුද සේවාවන් වෙනුවෙන් කරනු ලබන වියදම් බොහෝ මාර්ගවලින් ආර්ථිකය මත ගැඹුරු ඍජු හානිකර බලපෑමක් ඇති කොට තිබේ" යයි සන්ඩේ ටයිම්ස් හි ආර්ථික අටුවාකරුවෙක් ලීවේ ය.

යුද්ධය වෙනුවෙන් කරන වියදම රාජ්‍ය නය රුපියල් බිලියන 2,607ක් දක්වා එනම් රටෙහි දල දේශිය නිෂ්පාදිතයටත් වඩා වැඩි ප්‍රමානයකට නැංවීමට දායක වී ඇති බව එම ලිපිය සටහන් කලේ ය. අයවැයෙන් වැඩිම මුදලක් - රුපියල් බිලියන 373ක්- වෙන් කරනු ලැබ ඇත්තේ නය ගෙවීමට යි. අධික පොලී රේට්ටු මත ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලෙන් තවත් ඇමරිකානු ඩොලර් මිලියන 500ක් නයට ගැනීමට ආන්ඩුව කටයුතු කොට ඇති අතර එය නයබර තව දුරටත් ඉහල දමනු ඇත.

සංගත ප්‍රභූ කොටස් යුද්ධයේ ආර්ථික බලපෑම පිලිබඳව ගැඹුරින් ම සංවේ දී ය. "ආරක්ෂක වියදම් ඉහලයාම ගම්‍ය කරන්නේ මහා පරිමාන ආයෝජන ව්‍යාපෘතීන්වලට යොදවන මුදල් කපා හැරෙනු ඇති බව යි. උද්ධමන අනුපාතය දරා ගත නො හැකි මට්ටමක පවතිද්දී නිර්මානශීලී නො වන අංශවලට එවැනි ආකාරයකින් වියදම් වැඩි කිරීම ආර්ථිකය මත ඍනාත්මක ලෙස බලපානු ඇත" යයි ව්‍යාපාරික මන්ඩලවල එකතුවක් වන සාමය සඳහා ව්‍යාපාර සංධානය සඳහන් කලේ ය.

උද්ධමන රේට්ටුව අවුරුදු 17ක් තුල එහි ඉහල ම මට්ටමට ලඟා වී ඇත. කොලඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව සියයට 17.7ක් වූ ඔක්තෝබර් මාසයේ වාර්ෂික උද්ධමන රේට්ටුව ශ්‍රී ලංකා මිල දර්ශකයට අනුව සියයට 22 කි. රාජ්‍ය සහනාධාර කපා හැරීම අත්‍යවශ්‍ය භාන්ඩ මිල යෝධ ලෙස ඉහල දමා ඇත. ජනවාරි මාසයේ දී රුපියල් 39ක් වූ පිටි කිලෝවක මිල සැප්තැම්බරය වනවිට රුපියල් 65කට නැගුනි. ජනවාරි මාසයේ දී රුපියල් 140ක් වූ ප්‍රචලිත කිරි පැකට්ටුවක මිල ඔක්තෝබරයේ දී රුපියල් 250ක් විය.

උද්ධමන ගින්නට තව දුර තෙල් දමමින් භාන්ඩාගාරයේ මුදල් හිඟය පියවා ගැනීමට ආන්ඩුව සල්ලි අච්චුගැසීමට යොමු ව ඇත. 2006 වසරේ දී රුපියල් බිලියන 24.8ක් මුද්‍රනය කල මහ බැංකුව 2007 මුල් කාර්තුවේ දී තවත් රුපියල් බිලියන 15.9ක් මුද්‍රනය කලේ ය.

රාජපක්ෂ ආන්ඩුව, ඉහල යන උද්ධමනයට මුහුනදීම සඳහා වැටුප් ඉහල දමා ගැනීමට වර්ජනයේ යෙදෙන කම්කරුවන්ගේ ඉල්ලීම් යලි යලිත් ප්‍රතික්ෂේප කොට ඇත. ආන්ඩුවට මුදල් නොමැති බව ප්‍රකාශ කල ඇමතිවරු යුද උත්සාහය කඩාකප්පල් කරන බවට කම්කරුවන්ට චෝදනා කලහ. වැඩෙන කෝපය මැඩලීමට ජීවන වියදම් දීමනාව ජනවාරි මාසයේ දී රුපියල් 375 කින් හා මාස 6කට පසුව යලිත් එම ගනනින් ම ඉහල දමන බවට රාජපක්ෂ නිවේදනය කලේ ය. බඩුමිල අහස උසට නගිමින් තිබෙන තතු තුල මෙම දීමනාවන් මෙන් ම දුප්පතුන්ට දී ඇති අනෙකුත් සහනාධාර ද ක්ෂනිකව අතු ගෑවී යනු ඇත.

උපාධිධාරීන් 15,000කට රැකියා ලබාදෙන බවට ද ජනාධිපතිවරයා පොරොන්දු වූ නමුත් ඒ පිලිබඳ කිසිදු විස්තරයක් ඉදිරිපත් නො කලේ ය. ගිය වසරේ දී උපාධිධාරීන් සඳහා රැකියා 10,000ක් ලබා දෙන බව නිවේදනය කෙරුන ද රැකියා ලැබුනේ 2,088 දෙනකුට පමනි. පසුගිය මාස දෙකේ දී රැකියා ලබාදෙන ලෙස ඉල්ලා සිටි රැකියා විරහිත උපාධිධාරීන්ගේ විරෝධතා පෙලපාලි විසුරුවා හැරීමට පොලීසිය ක්‍රියා කර ඇත. රටේ රැකියා වියුක්තිය සියයට 6.5ක් පමනක් බවට රාජපක්ෂ පාරම්බෑව ද අවුරුදු 15-29 අතර තරුන ජනයා අතර විරැකියා අනුපාතය සියයට 19කට නැග ඇත්තේ බොහෝ දෙනාට හමුදාවට බැඳීමට බල කෙරෙමිනි.

බදු බර තථ්‍ය ලෙස ඉහල දමනු ලැබ ඇත. "2008 අයවැයේ එකම නිශ්චිත කාරනාව වන්නේ එය දැනටමත් දිවයින පුරා සියයට 22ක උද්ධමන අතුරක් මත දුවන මේ රටේ ජනයා මත තව තවත් බර පටවන බවයි. ආදායම් ඇස්තමේන්තු පෙන්වා දෙන්නේ 2008 දී භාන්ඩ හා සේවා මත සමස්ත බද්ද යෝධ සියයට 25කින් ඉහල යනු ඇති බවයි. පාරිභෝගික බදුවල එවැනි ඉහල යාමක් පොහෙසතුන්ට වඩා දුප්පතුන්ට වේදනා ගෙනදෙනු ඇතැයි යන්න රහසක් නො වේ " යයි ආර්ථික විශ්ලේෂක හර්ෂ ද සිල්වා ඩේලි මිරර් පත්‍රයේ සඳහන් කලේ ය.

පුලුල්ව පැතිර පවත්නා අතෘප්තියෙන් වාසි ලබාගැනීමේ අපේක්ෂාවෙන් පසුවන විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) තමන් අයවැයට විරුද්ධ වන බව ප්‍රකාශ කර ඇත. එහෙත් ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අයවැය නිර්මානය කොට ඇත්තේ අසීරු දේශපාලන උභතෝකෝටිකයකි. එල්ටීටීඊයට එරෙහි යුද්ධය උත්සන්න කරන ලෙස ඉල්ලා සිටින අතරම ජවිපෙ කම්කරුවන් හා දිලින්දන් වෙනුවෙන් පෙනී සිටින බවක් ද මවාපායි.

ජවිපෙ නායකයන් අයවැයට ප්‍රතිචාර දක්වා ඇත්තේ පුහු තර්ජන හා උස් හඬැති විවේචන වලිනි. පෞද්ගලික අංශ හාම්පුතුන්ව වැටුප් වැඩිකිරීමට පොලඹවා නොමැති නිසා තමන් "එම අංශයේ කම්කරුවන් වීදිවලට ගෙන එන" බව ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත සමරසිංහ ප්‍රකාශ කලේ ය. පක්ෂයේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ලාල් කාන්ත වැඩ වර්ජන හා විරෝධතා පිලිබඳව අනතුරු අඟවා ඇත.

ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ, ඉහල යන උද්ධමනය සහ බදුබර හේතුවෙන් තම පක්ෂය අයවැය පිලිබඳව තෘප්තිමත් නො වන බව රිවිර පුවත්පතට පැවසී ය. එහෙත් එම තානයෙන් ම " අයවැය පිලිබඳ පක්ෂයේ තීරනය බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට එරෙහිව ආරක්ෂක හමුදා දියත් කොට තිබෙන යුද්ධය ආදී රටේ ඉස්මතු වී තිබෙන දේශපාලනික කාරනා මත රඳ පවතින බව" කී ඔහු " ආරක්ෂක වියදම් ඉහල දැමීම පිලිබඳ කිසිදු ගැටලුවක් නැතැයි" ද කීවේ ය.

පාලක සංධානයේ කොටස් කාරයකු නො වන නමුත් පාර්ලිමේන්තුව තුල ආන්ඩුවට සහාය දක්වන ජවිපෙ තමන් අයවැයේ දී ඡන්දය දෙන්නේ කවර අතටදැයි තවම ඇඟවුම් කර නැත. ජවිපෙ අයවැයට එරෙහි වුවහොත් රාජපක්ෂ ආන්ඩුවට එහි පියවරයන් අනුමත කරගැනීම සඳහා අතිශය අස්ථාවර පක්ෂවල සහාගයක් මත රැඳී සිටී. යන්තම් මන්ත්‍රීවරු හයදෙනෙක් විපක්ෂයට එක් වුවහොත් අයවැය පරාජය කල හැක. ජවිපෙ අයවැයට පක්ෂව ඡන්දය පාවිච්චි කලහොත් හෝ ඡන්දයෙන් වැලකුනහොත් එහි ග්‍රාමීය සිංහල පදනම ද ඇතුලුව එහි පදනමට වලකැපී එහි ජනතාවාදී වාචාලයන් තව දුර හෙලිදරව් වනු ඇත.

අයවැය විවාදයේ ක්ෂනික ප්‍රතිඵලය කුමක් වුවත් පුපුරා හැලෙන යුද්ධය ද එහි ආර්ථික බර ද ස්ඵෝඨකාත්මක සමාජ අරගලයන්ට වේදිකාව සකසමින් සිටී.

© www.wsws.org